රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 6/99(1)

මගේ අංකය: ආ/III/5/8-1
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1999.05.25 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම.**

ඉහත මැයෙන් වූ 1999.02.22 දිනැති අංක 6/99 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අදාලව විවිධ විමසීම් ලැබී ඇත. එම ප්‍රශ්ණ සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන මෙන් දන්වමි.

(I) **නිලධාරීන්ට අනුයුක්ත කරනු ලැබ ඇති නිල වාහනවල රියදුරන්ට අතිකාල හා සංයුක්ත දීමනා**

නිලධාරීන්ට අනුයුක්ත කරනු ලැබ ඇති නිල වාහනයක් ධාවනය කරනු ලබන රියදුරකුට විශේෂ රාජකාරී අවශ්‍යතා මත දැනට අනුමත උපරිම සීමාව ඉක්මවා අතිකාල දීමනා හා සංයුක්ත දීමනා ගෙවීය යුතු වන අවස්ථාවන්හිදී අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකුගේ අනුමැතිය මත ගෙවිය හැක. මෙම ගෙවීම් අනුමත කිරීමේදී අදාළ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන නොඉක්ම වීමට ලේකම්වරුන් වග බලා ගත යුතුය.

(II) **ගරු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්වරුන්ට, සම්බන්ධීකරණ ලේකම්වරුන්ට හා මහජන සම්බන්ධතා නිලධාරීන්ට ඉන්ධන දීමනා ගෙවීම්.**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/99 හි ඇමුණුම 1 ප්‍රකාර ඉහත නිලධාරීන්ට වෙන වෙනම ඉන්ධන දීමනා ගෙවිය යුතු අතර ඔවුන් විසින්ම සිය ගමන් සඳහා ඉන්ධන වියදම් දැරිය යුතුය. ඔවුනට අනුයුක්ත වාහන වලට අමාත්‍යාංශවල ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන නිකුත 'නොකළ යුතුය.

(III) **ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ මහජන සම්බන්ධතා නිලධාරීන්ට ඉන්ධණ දීමනාව**

ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්ට ගෙවන පදනම මහජන සම්බන්ධතා නිලධාරීන්ට ද අදාල වේ.

(IV) **අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරුන්ට හිමි මාසික ඉන්ධන දීමනාව**

මෙම නිලධාරීන්ට අංක 6/99 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 1 හි (ඇ) යටතේ ඇති ඉන්ධන දීමනාව අදාල වේ.

(V) **මෙම ඉන්ධන දීමනාව ජාතිය රැක ගැනීමේ අරමුදලට දායකවීම් වෙනුවෙන් ගණන් ගැනේද නැද්ද යන කරුණ පිළිබඳ තත්ත්වය.**

මෙම ඉන්ධන දීමනාව ජාතිය රැක ගැනීමේ අරමුදලට දායකවීම වෙනුවෙන් ගණන් නොගැනේ.

02. මෙම උපදෙස් මහා භාණ්ඩාගාරයේද එකගත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

පී.ඒ.සේනාරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.